*ප්‍රතිශෝධිත මුද්‍රණය*

අංක. 45.]

(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 පෙබරවාරි මස 05 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0223/'09

1\. ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "මාතර සංවර්ධන අරමුදල" නමින් අරමුදලක් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූයේද;

(ii) එසේ නම්, එය ආරම්භ කළේ කවදාද;

(iii) එම අරමුදල ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේදය තුළ ධීවර අමාත්‍යධුරය දරන ලද්දේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලට අදාළ බැංකුව හා බැංකු ගිණුම් අංකය කවරේද;

(ii) එම අරමුදලට මුදල් ලැබුණු මූලාශ්‍රයන් කවරේද;

(iii) අරමුදල් ලෙස ලැබුණු ප්‍රමාණය කොපමණද;

(iv) එම අරමුදලේ මුදල් යොදවා තිබෙන්නේ කවර කටයුතු සඳහාද;

(v) ඒ කොපමණ මුදල් ප්‍රමාණයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0581/'09

2\. ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල සහ උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0638/'09

3.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජංගම දුරකථන සඳහා පරිසර සංරක්ෂණ බද්දක් පනවා තිබේද;

(ii) එසේ නම්, කෙදිනක සිට මෙම බදු අයකිරීම ආරම්භ කරන ලද්දේද;

(iii) 2009 වර්ෂයේ මෙම බද්ද හේතුවෙන් කොපමණ මුදලක් අයකර ගැනීමට අපේක්ෂා කරන්නේද;

(iv) එසේ බදු අයකළේ නම්, කොපමණ මුදලක් මහා භාණ්ඩාගාරයට යවා තිබේද;

(v) බදු මුදලින් කොපමණ ප්‍රමාණයක් ජංගම දුරකථන හේතුවෙන් හානිවන පරිසරය සංරක්ෂණය කිරීමට යොදවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ජංගම දුරකථනවල භාවිතා කර ඉවත දමන බැටරි කොපමණ සංඛ්‍යාවක් පරිසරයට හානියක් නොවන පරිදි 2009 වර්ෂයේදී ඉවත්කරන ලද්දේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0722/'09

4.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 10 ක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) නාවික හමුදාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) වැටුප් හා වේතන සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) පසුගිය අවුරුදු පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී නාවික හමුදාවේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රෙජිමේන්තුවක හෝ කණ්ඩායමක සිටින නාවික හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පදනම මත සේවයේ යොදවන ලද සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0753/'09

5.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පසුගිය කෝප් (රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා) වාර්තාවට අනුව, හෙජින් ගිවිසුම නොතිබුණා නම් දැනට වඩා විශාල අඩු මුදලකට ඉන්ධන ලබාදීමට හැකි බව එතුමා දන්නෙහිද?

(ආ) හෙජින් ගිවිසුම කැබිනට් මණ්ඩලයෙන් අනුමත කර තිබූ බැවින් ගිවිසුම නිසා ශ්‍රී ලංකාවට ඇති වූ පාඩුව වන රු. කෝටි 8,000 ට කැබිනට් මණ්ඩලයද වගකිවයුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0798/'09

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කය පුරා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගේ ඡායාරූපය සහිත බාහිර ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කය පුරා මේ දක්වා සවිකර ඇති බාහිර ප්‍රචාරක දැන්වීම් පුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා සවිකරන ලද්දේ කවර ආයතනයකින්ද;

(iii) එක් දැන්වීම් පුවරුවක් සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) ඒ අනුව, දැන්වීම් පුවරු සඳහා මේ දක්වා වැයකර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම බාහිර ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකිරීම වෙනුවෙන් අදාළ ආයතනය වෙත මුදල් ලබාදෙන ලද්දේ කවර ආයතනයක් මගින්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0801/'09

7.

ගරු රේණුකා හේරත් මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි 08 වන පිටුවේ සටහන පරිදි පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සියල්ල එකම ජාත්‍යන්තර ප්‍රමිතියකට ගෙන ඒමට පියවර ගෙන තිබේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයිනේ පෙර පාසල් සංඛ්‍යාව සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව දැනට මෙම ප්‍රමිතිය ලබාදී ඇති පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) පුහුණුව සහ මූල්‍ය පහසුකම් ලබා දී ඇති පෙර පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(iii) ඒ අනුව එක් පෙර පාසල් පාලිකාවකට ලබාදී ඇති මූල්‍ය පහසුකම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0810/'09

8\.

ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 වර්ෂයේ වතු නියෝජිත තැපැල් කාර්යාල තැනීමට කොපමණ මුදලක් වෙන් කළේද;

(ii) එම මුදලින් ඉදිකළ තැපැල් කාර්යාල සංඛ්‍යාව, ඉදිකර තිබෙන දිස්ත්‍රික්ක සහ වතු කවරේද;

(iii) එම තැපැල් කාර්යාල අතුරින් කොපමණ සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසාදමා ඇති තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) වසාදමා ඇති තැපැල් කාර්යාලවලින් අනාගතයේදී ගැනීමට අපේක්ෂිත ප්‍රයෝජන කවරේද;

(iii) ඒ සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0489/'09

9\.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2000 වර්ෂයේ සිට වන්දි හිමිකම් ලැබීමට නියමිත ආරක්ෂක හමුදාවේ පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වන්දි හිමිකම් ලෙස ලබාදෙන මුදල කොපමණද;

(iii) මේ වන විට කොපමණ සංඛ්‍යාවකට වන්දි හිමිකම් ලබා දී තිබේද;

(iv) අදාළ වන්දි හිමිකම් ලබාදීම කල් ගතවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0687/'09

10\.

ගරු විජිත රණවීර මහතා,— කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1980 ජූලි වර්ජකයින්ගේ හිඟ වැටුප් ගෙවීමට රාජ්‍ය අංශයේ සේවකයන්ට සහන ලබා දෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සංස්ථා සේවකයන්ටත් අදාළ වනසේ භාණ්ඩාගාර අනුමතිය ලබාදී තිබේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාළ චක්‍රලේඛය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) පේෂකර්ම ජූලි වර්ජකයින් සඳහා හිඟ වැටුප් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී තිබේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) (i) ගෙවීම් කිරීමට කම්කරු කොමසාරිස් ජනරාල් විසින් එම වර්ජකයින්ගෙන් නිවැරදි හිමිකරුවන් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ සංඛ්‍යාව, නම, ලිපිනය, සේවා කාලය හා ලැබිය යුතු හිඟ වැටුප් ප්‍රමාණය කොපමණද;

(iii) හිඟ වැටුප් සම්පූර්ණයෙන් ගෙවා නිමකර ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) හිඟ වැටුප් ගෙවීමට විශේෂ දිවුරුම් ප්‍රකාශ ඔවුන් සියලු දෙනාගෙන්ම ලබාගත්තේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) හිඟ වැටුප් ගෙවා නොමැති අයට එය ගෙවනු ලබන්නේ කවදාද යන්න සවිස්තරව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද?

0723/'09

11\.
ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 10 ක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) ගුවන් හමුදාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) වැටුප් හා වේතන සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) පසුගිය අවුරුදු පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ගුවන් හමුදාවේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රෙජිමේන්තුවක හෝ කණ්ඩායමක සිටින ගුවන් හමුදා සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පදනම මත සේවයේ යොදවන ලද සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0754/'09

12\.
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත් ශ්‍රී ලංකාව තුළ සිදු වූ බරපතල මානව හිමිකම් කඩවීම් ගණනාවක් සම්බන්ධයෙන් පත් කෙරුණු "උදලාගම කොමිසම" රජය විසින් අහෝසි කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) එසේනම්, එලෙස අහෝසි කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උදලාගම කොමිසම පරීක්ෂණයට භාජනය කෙරුණු සිද්ධීන් ගණනාවකින් එකක් හෝ පරීක්ෂණ අවසන් කිරීමට පෙර මෙම කොමිසම අවලංගු කිරීම ශ්‍රී ලංකා රජය ජිනීවා මානව හිමිකම් කොමිසමට දුන් පොරොන්දු කඩකිරීමක් බවත්;

(ii) උතුරු නැගෙනහිර සරණාගත් කඳවුරුවල සිටින සරණාගතයන් අතුරෙන් 60%ක් කුඩා දරුවන්, බාලවයස්කාරයින්, වයස්ගත පිරිමින් හා කාන්තාවන් බැවින් එම අය මෙලෙස රඳවා තබාගැනීම ජාත්‍යන්තර මානව හිමිකම් වලට පටහැනි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0799/'09

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට 2009 වර්ෂයේ මේ දක්වා දිවයින පුරා වාර්ෂිකව සිදු වී ඇති රිය අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින්, මාරක රිය අනතුරු සංඛ්‍යාව හා සාමාන්‍ය රිය අනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම රිය අනතුරු අතුරින් අධික වේගයෙන් ධාවනය කිරීම හේතුවෙන් සහ මත්ද්‍රව්‍ය ගැනීමෙන් පසු රිය ධාවනය කිරීම හේතුවෙන් සිදුවී ඇති අනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම අනතුරු හේතුවෙන් මියගිය හා තුවාල ලැබූ හෝ ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙසේ දිවයින පුරා සිදුවන රිය අනතුරු වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0670/'09

14.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දකුණු පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල නිලධාරීන් ඇගයීමේ උත්සවයක් 2009 ජුලි මස අගදී පැවැත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) එම උත්සවයට සහභාගී වූ අමාත්‍යවරුන්ගේ නම් හා තනතුරු කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) සම්මාන හිමිවූ කලාප අධ්‍යාපන කාර්යාල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල නිලධාරීන්ගේ නම් සහ තනතුරු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0755/'09

15.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ ශ්‍රී ලංකා නියෝජිත දයාන් ජයතිලක මහතා ඉන් ඉවත් කිරීමට හේතුව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවට එරෙහිව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම (එ. ජා. මානව හිමිකම් කොමිසම) තුළ පැවති ඡන්ද විමසීමකදී, ශ්‍රී ලංකාව ජයග්‍රහනය කළේ දයාන් ජයතිලක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය ක්‍රියාත්මක කිරීමට දුන් පොරොන්දුව නිසා බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

රජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා,— මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන),— ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම්වල හෝ ජන කැළඹීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන්ගේ ද, ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ස්වභාවික ව්‍යසනයක් හෝ විපත්තියක් මරණයට හේතුව වශයෙන් සෘජුව ම ආරෝපණය කළ හැකි තැනැත්තන්ගේ ද මරණ ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

2.

අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ප්‍රජා පාදක විශෝධන (සංශෝධන),— ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයාගේ තනතුරු නාමය වෙනස් කිරීම සඳහා ද ඊට ආනුෂංගිකව වෙනත් ලිඛිත නීතිවල ද අවශ්‍ය සංශෝධන සිදු කිරීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2010 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

6.

ගරු ආර්. එම්. රංජිත් මද්දුමබණ්ඩාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

7.

ගරු සරණ ගුණවර්ධන මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" ටී. බී. ඒකනායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

8.

ගරු මොහොමඩ් ෂෆීක් රාජබ්දීන් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" 1957 අංක 13 දරන ලංකා බාලදක්ෂ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද, සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2010 පෙබරවාරි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*11.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*12.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*14.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*18.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

ජාතික කාන්තා කොමිෂන් සභාව පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*22.

ජාතික සේවක අධ්‍යයන ආයතන පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*23.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*24.

පළාත් සභා (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*25.

ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 අගෝස්තු මස 21 දිනැති අංක 1615/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.01.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*26.

ඉඩම්, ඉඩම් සංවර්ධන, ජනාවාස සහ රණවිරු සුභසාධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 අගෝස්තු මස 24 දිනැති අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.01.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1),—ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ එකී පනතේ 14 වගන්තිය සමඟ කියවිය යුතු, ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදනු ලදුව, 2009 නොවැම්බර් මස 09 දිනැති අංක 1627/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.12.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 2),—ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් මස 09 දිනැති අංක 1627/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.12.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 3),—ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් මස 09 දිනැති අංක 1627/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.12.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය

කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*34.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ වූ නියෝග,— 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සිගරැට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූලි මස 17 වැනි දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10. 08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*35.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*36.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*37.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*38.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*39.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*40.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*41.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*42.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*43.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

44.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

45.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

46.

දේශමාන්‍ය එච්. කේ. ධර්මදාස කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

47.

ශ්‍රී පියරතන ප්‍රජා සංවර්ධන සහ සමාජීය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

48.

ග්ලෝබල් හ්‍යුමනිටේරියන් ෆවුන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

49.

ශ්‍රී ධම්මාලංකාර සමාජසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

50.

රතු පියුම (ජාත්‍යන්තර) ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

51.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

52.

සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

53.

හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

54.

මාළිගාවත්ත ජනාසා සහ සුභසාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

55.
පුලතිසි දරුවෝ පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0582/'09

1.
ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0583/'09

2.
ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0584/'09

3\.

ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0585/'09

4\.

ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0586/'09

5.

ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අගුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0587/'09

6.

ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0588/'09

7.

ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0589/'09

8.

ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0590/'09

9. ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0591/'09

10. ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0592/'09

11.
ගරු විජිත රණවීර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?